ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**දෙසැම්බර් 2017**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 දෙසැම්බර් මාසයේ දී 59.1 ක දර්ශක අගයක් වාර්තා කරන ලද අතර, එය 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 0.3 ක සුළු ඉහළ යාමකි. ඒ අනුව, 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේ දී නිෂ්පාදන කටයුතු වැඩි වේගයකින් වර්ධනය වීමක් පිළිඹිබු වේ. මේ සඳහා, විශේෂයෙන්ම නිෂ්පාදන උප දර්ශකයේ ඉහළ යාම හේතු විය. තවද, 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව ගැනුම් තොග සහ සේවා නියුක්ති යන උප දර්ශක ද වැඩි වේගයකින් වර්ධනය වූ අතර, නව ඇණවුම් උප දර්ශකය අඩු වේගයකින් වර්ධනය විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සඳහා අදාළ වන උප දර්ශකය පසුගිය මාසයට සාපේක්ෂව වැඩි වේගයකින් වර්ධනය විය. තවද, සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලද අතර, ඒ අනුව නොවැම්බර් මාසයේ දී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සමස්තයක් ලෙස වර්ධනයක් පිළිඹිබු කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 නොවැම්බර් මාසයේ දී වාර්තා වූ 57.4 ක දර්ශක අගයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේ දී 61.2 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. 2017 දෙසැම්බර් මාසයේ දී සේවා අංශය වැඩි වේගයකින් වර්ධනය වූ බව මෙමගින් පෙන්නුම් කෙරෙයි. නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්ති, නිම කිරීමට ඇති කාර්යයන් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උපදර්ශක සියල්ල මෙම වර්ධනය සඳහා දායක විය. මෙය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පිළිබඳ සමීක්ෂණය ආරම්භ කළ 2015 මැයි මස සිට, නිම කිරීමට ඇති කාර්යයන් උපදර්ශකය කඩයිම් මට්ටම ලෙස සැලකෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලද ප්‍රථම අවස්ථාවයි. සේවා අංශයෙහි වර්ධන උපනතියක් තවදුරටත් පෙන්නුම් කරමින් නව ව්‍යාපාර උපදර්ශකය මාස හයකින් වාර්තා කල ඉහලම අගය වාර්තා කළේය. උත්සව සමයේ වර්ධනය වූ ඉල්ලුම් තත්ත්වය; සහ දේශීය සහ විදේශීය සංචාරක කර්මාන්තවල සිදු වූ වර්ධනය හේතුවෙන් ප්‍රධාන වශයෙන් තොග සහ සිල්ලර වෙළෙඳාම; සහ නවතැන් සහ ආහාරපාන සැපයීමේ උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් දක්නට ලැබුණි. උත්සව සමයේ වර්ධනය වූ ඉල්ලුම් තත්ත්වය හේතුවෙන් අය කරන මිල ගණන් 2017 නොවැම්බර් මාසයට සාපේක්ෂව දෙසැම්බර් මාසයේ දී වැඩි වේගයකින් ඉහළ ගියේය. 2017 වසරේ භාවිතා නොකළ නිවාඩු සඳහා මුදල් ගෙවීම සහ සාමූහික වැටුප් ගිවිසුම් යටතේ 2018 වසරේ අපේක්ෂිත වැටුප් වර්ධන හේතුවෙන් 2017 දෙසැම්බර් මාසයේ දී අපේක්ෂිත ශ්‍රම පිරිවැය ඉහළ යන ලදී.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | 54.3 | 54.4 | 59.0 | 54.8 | 58.8 | 59.1 |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | 59.1 | 60.1 | 57.0 | 55.3 | 57.4 | 61.2 |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.